සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

# පෙරදිග සංගීතය

**8 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 06 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ''| ස රි | ග - ම | ප ප | ප - ස̇ |
| නි නි | ධ - නි | ධ ප | ප - ප |'' මෙම ස්වර පාද දෙක අයත් වන්නේ,

(i) භූපාලි රාගය ආශ්‍රිත ස්වර ස්ථාපන ගීතයට ය.

(ii) කාෆි රාගය ආශ්‍රිත ස්වර ස්ථාපන ගීතයට ය.

(iii) බිලාවල් රාගය ආශ්‍රිත ස්වර ස්ථාපන ගීතයට ය.

(iv) භූපාලි රාගය අයත් මධ්‍යලය ගීතයට ය.

02 ''මොර හිඹුටු දම් පනා'' මෙම ගී පාදය ගැයීම සඳහා සුදුසු දේශීය තාල රූපය වන්නේ,

(i) සුළු තනි තිතයි. (ii) මැදුම් තනි තිතයි.

(iii) සුළු මැදුම් දෙතිතයි. (iv) මැදුම් මහ දෙතිතයි.

03 බයිලා කපිරිඤ්ඤා ගිතවල දී බහුලව භාවිත කරන , '' අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ'' වැනි ගීත සඳහා යොදාගත හැකි බටහිර තාල රූපය වන්නේ,

(i) six eight (6/8) (ii) four four (4/4) (iii) three four (3/4) (iv) seven eight (7/8)

04 ඉන්දියාවේ වංග ප්‍රදේශයේ ප්‍රචලිත , වංග ජන ගී ආශ්‍රයෙන් ගොඩනැගුන ගීත ශෛලිය නිර්මාණය කළේ,

(i) බිම්සෙන් ජෝසි සංගීතවේදියා ය. (ii) රවීන්ද්‍රනාත් තාගෝර් තුමා ය.

(iii) අනූප් ජලෝටා ශිල්පියා ය. (iv) අමීර්ඛුෂ්රු සංගීතවේදියා ය.

05 දෙවියන්ගේ ගුණ ගායනය සඳහා නිර්මාණය වූ ගී විශේෂයකි,

(i) රවීන්ද්‍ර ගී (ii) ඛ්‍යාල් ගී (iii) ගසල් ගී (iv) භජන් ගී

06 ''දෙවන් පහන් මිණි නගා - වඩිනු සුදතුනේ'' මෙම ගීතය

(i) ස්වර ස්ථාපන ගීයකි. (ii) කිතුණු බැති ගීයකි.

(iii) බොදු බැති ගීයකි. (iv) සරල ගීයකි.

- **ප්‍රශ්න අංක 07 සිට 10 දක්වා A, B කොටස් ගැලපෙන ලෙස යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 07 | තෙල් ගාලා හිස පීරන් නැනෝ | සරල ගීයකි |
| 08 | ඉරු දෙවියෝ වැඩිය තැනේ | නෙළුම් ගීයකි |
| 09 | රිදියෙන් තනලා රත්රන් ඔපලා | කමත් ගීයකි |
| 10 | සිරි සරුසාර කෙතේ ගොයම් පැසීලා මහිමේ | ගොයම් ගී |

- **පහත අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11 රවිශංකර් අති දක්ෂ සිතාර් වාදකයෙකි. ( )

12 සිතාරයේ කෝමල රිෂභය හා ධෛවතය සඳහා පර්දා දෙක බැගින් ඇත. ( )

13 සිතාරයේ හා එස්රාජයේ ස්වර පිහිටීම සමාන ය. ( )

14 එස්රාජය බෝ (bow) වෙන් වාදනය කරයි. ( )

15 සිතාරයේ ප්‍රධාන තත් 08ක් ඇත. ( )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

16 ''මොකද මැණිකේ හනික යන්නේ'' මෙම ගී පාදය සඳහා යොදාගත හැකි හින්දුස්ථානී තාලය කුමක්ද?

17 ''සිරස නමමු මව් පොළොවට'' මෙම ස්වර ස්ථාපන ගීතය අයත් රාගය කුමක්ද?

18 මද්දල දෙකකින් අඩුතාල් වැඩිතාල් වාදනය කරන රංග සම්ප්‍රදාය කුමක්ද?

19 හින්දුස්ථානී සංගීතය ඇසුරෙන් ගොඩනැගුන නිර්දේශිත රංග සම්ප්‍රදාය කුමක්ද?

20 ''කොබෝ කුරුලු වගේ'' මෙම ගී පාදයේ සඳැස්මත් ගණන කීය ද?

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) ඔබ උගත් කැමති රාගාශ්‍රිත ස්වර ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(ii) භූපාලි රාගයේ යෙදෙන වර්ජිත ස්වර මොනවා ද? (ලකුණු 02)

(iii) ''සිරිසාර අතිශාන්ත'' යන ගීතය සඳහා වාදනය කිරීමට සුදුසු හින්දුස්ථානී තාලය නම් කරන්න. (ලකුණු 02)

02 A x-/x--/x-/x--

B xxx/x--- /xxx/x---

C xx/xxxx/xx/xxxx

(i) ඉහත සඳහන් රිද්ම රටාවලට අයත් දෙතිතට අදාල තිත් රූප තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) මාත්‍රා 2/3 තිත් රූපයට අයත් උඩරට බෙර පදය නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.(ල.04)

(iii) මාත්‍රා 3/4 තිත් රූපය නම් කර ඊට ගැළපෙන ජන ගීතයක මුල් ගී පාදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

03 (i) නූර්ති රංග ශෛලියේ විශේෂ ලක්ෂණ 03ක් ලියන්න. (ලකුණු 03)

(ii) නූර්ති නිෂ්පාදකවරු දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(iii) ඔබ දන්නා නාඩගම් ගීතයක් ලියා දක්වන්න. (ලකුණු 05)

04 | ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - - |

(i) ඉහත ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

(ii) ඉහත ස්වර ප්‍රස්තාරය සඳහා වැයීමට සුදුසු හින්දුස්ථානි තාලය නම් කරන්න. (ලකුණු 02)

(iii) එම තාලය තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

05 (i) යතිය හඳුන්වන්න. (ලකුණු 02)

(ii) යතියෙහි ප්‍රභේද නම් කරන්න. (ලකුණු 02)

(iii) ''කොබෝ කුරුලු වනේ'' යන ගී පාදය ප්‍රස්තාර කර එහි යතියට හිමි මාත්‍රා ගණනය කරන්න.(ල.04)

(iv) ඉහත ගී පාදයේ ගීමත් ගණන කීයද? (ලකුණු 02)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 2 (02) 3 (03) 1 (04) 2 (05) 4 (06) 2 (07) නෙළුම් ගීයකි
(08) කමත් ගී (09) ගොයම් ගී (10) සරල ගී (11) ✓ (12) × (13) ✓
(14) ✓ (15) × (16) දීප්චන්දි තාලය (17) බිලාවල් රාගය (18) නාඩගම් රංග සම්ප්‍රදාය
(19) නූර්ති රංග සම්ප්‍රදාය (20) 09 යි

(1 x 20 = 20)

## II කොටස

01 (i) සිරස නමමු මව් පොළොවට / ඇහැළ මහට ඇහැළ ගහක / සිරිසාර අති ශාන්ත / හෝ හෝ ගා රැල්ල බිඳෙනවා යන ගීතවලින් කැමති ගීතයක ස්ථායී කොටස ලිවීමට ලකුණු 06යි.

(ii) ම , නි ස්වර (ලකුණු 02) (iii) ජ ප් තාලය (ලකුණු 02)

02 (i) සුළු මැදුම් දෙතිත , මැදුම් මහ දෙතිත , සුළු මහ දෙතිත

(ii) <u>සුළු මැදුම් දෙතිත</u>

| තිත් සංඥා | / | ^ | / | ^ |
|---|---|---|---|---|
| මාත්‍රා | 1 2 | 3 4 | 5 6 | 7 8 |
| උඩරට බෙර පදය | දොං ං | ජි ං ත | ග ත | දො ං ත |


(iii) උ දු ල / ත රු වැ ල / ව ත ල / සො ඳු රු - /

03 (i) විශේෂ ලක්ෂණ 03ක් ලියා දැක්වීම

(ii) සී දොන් බස්තියන් , නීතීඥ ජෝන් ද සිල්වා , නීතීඥ චාල්ස් ඩයස්

(iii) නාඩගම් ගීතයක් ලියා දැක්වීම

04




(i) රේඛා මණ්ඩල ඇඳ දැක්වීම
ස්වර ලකුණු කිරීම

(ii) ත්‍රි තාලය

(iii) ත්‍රි තාලය තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීම

05 (i) පැදියක සඳැස්මත් ගණනට වඩා වැඩි වූ මත් ගණන පිහිටන ස්ථානය යතිය නමින් හැඳින්වේ.

(ii) කො බෝ - / කු රු ලු / ව නේ - / - - - /
මාත්‍රා 05 කි.

(iii) ගීමත් ගණන මාත්‍රා 12 කි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

**8 ශ්‍රේණිය**

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

* **පහත සඳහන් 1, 3, 4 ප්‍රශ්නවලට අයත් ගීත සඳහා ගායනය තෝරාගත් සිසුන් ගායනයෙන් ද වාදනය තෝරාගත් සිසුන් වාදනයෙන් ද ඉදිරිපත් කරන්න.**

(01) පහත සඳහන් ස්වර ස්ථාපන ගී අතරින් ඔබ කැමති ගීතයක් ගායනය/ වාදනය කරන්න.
   * බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක්
   * භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක්
   * කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් (ලකුණු 10 යි.)

(02) ජප් තාලය (ඣප්) හෝ දීප්චන්දි තාලය අතින් තාල තබා පෙන්වන්න. (ලකුණු 05 යි.)

(03) නූර්ති, නවනාට්‍ය, නාඩගම්, රවීන්ද්‍ර ගී, භජන් ගී මින් ඔබ කැමති ගීතයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 05 යි.)

(04) සරල ගී, දමිල ගී, පියගුණ වරුණ ගී, මවුගුණ වරුණ ගී අතරින් කැමති ගීතයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 05 යි.)

(05) නෙළුම් ගී, කමත් ගී, කිතුණු බැති ගී මින් ඔබ කැමති ජන ගීතයක් ගායනය කරන්න. (ලකුණු 05 යි.)

(06)

(i) පහත සඳහන් ගී අතරින් ඔබ කැමති ගී වර්ගයක් ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් වාදනය කරන්න. (ලකුණු 10 යි)

(රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගී, නිර්දේශිත ජන ගී, සරල ගී, නූර්ති ගී, නව නාට්‍ය ගී, මවුපිය ගුණ ගී, නාඩගම්)

(ii) ඔබ කැමති වාද්‍ය භාණ්ඩයකින් (ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ හැර) කැමති ගීතයක් වාදනය කරන්න. (ලකුණු 10 යි)

(06 ප්‍රශ්නය (ii) කොටස සඳහා වාදනයෙන් ඉදිරිපත් වන සිසුන් ගායනයෙන් ඉදිරිපත් කරන්න)